

**සභාපති හෙන්රි බී. අයිරින් විසිනි**
පළමුවෙනි සභාපතිත්වයේ
පළමුවෙනි උපදේශකවරයා

# පවුල සහ මිතුරන් සදාකාලයටය

ඔබ කොහේ සිටියද, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පිහිටුවූ ශුභාරංචිය අනුව ජීවත්වීමෙන් ඔබ ලැබූ විශාල සතුට සොයන මිතුරන් ඔබට ඇත. එම සතුට වචනවලින් විස්තරකිරීමට ඔවුන්ට නොහැකිවිය හැකිය, නමුත් ඔවුන් එය ඔබගේ ජීවිතය තුල දකින විට ඔවුන්ට එය හඳුනාගත හැකිය. එම සතුටේ මාර්ගය සොයාගැනීමට ඔවුන්ට ආශාවක් ඇතිවිය හැක්කේ විශේෂයෙන්ම ඔවුන් මෙන් ඔබද පරීක්ෂාවන්ට මුහුණදෙන බව ඔවුන් දකින විටය.

ඔබ දෙවියන්වහන්සේගේ පණත් තබන විට එම සතුට ඔබට හැඟී ඇත. ශුභාරංචිය අනුව ජීවත්වීමේ ඵලය එයයි (බලන්න මොසායා 2:41). ඔබ අන් අයට පෙන්වීම සඳහා ඇදහිල්ලෙන් යුතුව ස්වාමීන් වහන්සේගේ පණත් තබන්නේ නැත. නමුත් ඔබගේ සතුට ගැන සොයන අය ස්වාමීන්වහන්සේ විසින් සූදානම්කරන්නේ නැවත පිහිටුවූ ශුභාරංචියේ යහපත් ආරංචි ඇසීම සඳහාය.

ඔබට ලබාදී තිබෙන ආශිර්වාද මගින් ඔබට යුතුකම් සහ අසිරිමත් අවස්ථාවන්ද නිර්මානයකර ඇත. ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හා ගිවිසුම් කල ගෝලයෙක් ලෙස, අන් අයට වැඩි සතුටක් ලබාගැනීමේ අවස්ථාවක්, විශේෂයෙන්ම ඔබගේ මිතුරන් සහ පවුලේ අයට ලබාදීමට ඔබ බැඳී සිටියි.

ස්වාමීන්වහන්සේ ඔබට ඇති අවස්ථාවන් දැක මෙම නියෝගය සමගින් එම යුතුකම් විස්තරකරනසේක, අනතුරු ඇඟවීම ලැබූ සෑම මිනිසෙක්ම තම අසල්වැසියාට අනතුරු ඇඟවිය යුතුය (බලන්න ධ්‍යසහසී 88:81).

ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය පිළිගෙන ඒ අනුව ජීවත්වනවිට ඔබගේ හදවතේ ඇතිවන වෙනස්වීම් තුලින් ස්වාමීන්වහන්සේ එම නියෝගය වඩාත් පහසුකරනසේක. එහි ප්‍රතිඵලයක් ලෙස, අන් අයට ඇති ඔබගේ ප්‍රේමය වැඩිවන්නේ, ඔබ අත්දුටු එම ප්‍රේමයම අන් අයටත් දීමට ඔබ තුල ඇති ආශාව නිසාය.

එම වෙනසේ එක් උදාහරණයක් නම්, ස්වාමීන්වහන්සේගේ ධර්මදූත කටයුතුවලට උපකාරකිරීම සඳහා එම වෙනස ඔබ පිළිගන්නා අන්දමයි. සොයාබලන්නෙකු ගැන ඉල්ලීමක් සඳහා උණුසුම් ප්‍රතිචාරයක් සැබෑ ලෙස හැරී ආවෙකුගෙන් බලාපොරොත්තු විය හැකි බව පූර්ණ-කාලීන ධර්මදූතයෝ ඉක්මණින් ඉගෙනගනිති. හැරී ආ අය ඔවුන්ගේ සතුට බෙදාගැනීම සඳහා මිතුරන් සහ පවුල් සාමාජිකයන් ගැන ආශාවෙන් සිටිති.

ඔබගේ කොට්ඨාශ ධර්මදූත නායකයා හෝ ධර්මදූතයන් විසින් ඉගැන්වීම සඳහා යමෙකුගේ නමක් ඉල්ලන විට, එය ඔබට විශාල ප්‍රශංසාවකි, මිතුරන් ඔබගේ සතුට දැක තිබෙන නිසා, එම මිතුරන් සුභාරංචිය අසා එය පිළිගැනීම තෝරාගැනීමට සූදානම්වන බව ඔවුහු දනිති. තවද ඔවුන් රාජ්‍යයට එන විට ඔවුන්ට අවශ්‍ය මිතුරා ඔබ බවටද විශ්වාසයක් ඔවුන්ට ඇත.

ධර්මදූතයන් මුණගැසීම සඳහා ඔබගේ මිතුරන්ට ආරාධනාකිරීමෙන් ඔබට ඔවුන්ව අහිමිවේයයි ඔබ බියයුතු නැත. ධර්මදූතයන්ව ප්‍රතික්ෂේපකළ මිතුරන් මට ඇත. නමුත් ඔවුන් මට වසර ගණනාවක් ස්තුති කලේ මට වටිනාකමක් තිබූ යමක් මා ඔවුන්ට පිරිනැමූ නිසාය. ඔබට සතුට රැගෙන ආ බව ඔවුන් දකින, සුභාරංචිය පිරිනැමීම තුලින් ඔබට සදාකාලයටම මිතුරන් ඇතිකරගත හැකිය. සතුටේ සැලසුම අනුගමනයකිරීම තෝරාගැනීමට, මිතුරෙකුට, විශේෂයෙන්ම පවුලේ

අයෙකුට, ආරාධනාකිරීමේ අවස්ථාවන් මග නොහරින්න.

සභාවේ දේවමාලිගා තුල එම ආරාධනාව කිරීමට වඩා වෙනත් විශාල අවස්ථාවක් තවත් නැත. එහිදී මෙම ජීවිතය තුලදී ගැලවීමේ නියෝග ලබා ගැනීමට නොහැකිවුන අපගේ මුතුන්මිත්තන්ට ඒවා පිරිනැමීමට ස්වාමීන්වහන්සේට පුළුවන. ඔවුන් ඔබ දෙස ප්‍රේමයෙන් සහ බලාපොරොත්තුවෙන් බලනු ඇත. ස්වාමීන්වහන්සේගේ රාජ්‍යයට පැමිණීමට ඔවුන්ට අවස්ථාව තිබෙන බව උන්වහන්සේ පොරොන්දුවී තිබෙනසේක (බලන්න ඩීසහසී 137:7–8), තවද ඔවුන් වෙත ප්‍රේමයක් උන්වහන්සේ ඔබගේ සිතේ දමා ඇතිසේක.

දේවමාලිගා නියෝග අන් අයට පිරිනැමීමෙන් ඔබ බොහෝ දෙනෙක් මහත් සතුටක් අත්විඳ ඇත. ඔබ ධර්මදූතයන්ට හමුවීම සඳහා මිනිසුන්ගේ නම් ඔවුන්ට දෙන විට එලෙසම සතුටක් ඔබට දැනෙනු ඇත. ඔබගේ මුතුන්මිත්තන් වෙනුවෙන් නියෝග ඉටුකරන විට, ඔබ ඊටත් වඩා සතුටක් අත්විඳ ඇත. අනාගතවක්තෘ ජෝසප් ස්මිත්ට එළිදරව් කළ පරිදි, අපගේ සදාකාලික සතුටට හැකියාවක් ලැබෙන්නේ, අපි එම ආශිර්වාද අපගේ මුතුන්මිත්තන්ට පරාර්ථ දේවමාලිගා නියෝග තුලින් ලබාගැනීමට උපකාරකල හොත් පමණකි (බලන්න ඩීසහසී 128:18).

නත්තල් සමයේදී අපගේ හදවත් අපගේ ගැලවුම්කරුවාණන් වෙත සහ උන්වහන්සේගේ ශුභාරංචිය අපට ලබාදුන් මහත් සතුට දෙස හැරේ. එම සතුට අපි අන් අයට පිරිනමන විට, අපි උන්වහන්සේ වෙත අපගේ කෘතඥතාවය වඩා හොඳින් පෙන්වන්නෙමු. අපි ධර්මදූතයන්ට නම් ඉදිරිපත්කරමින් සහ අපගේ මුතුන්මිත්තන්ගේ නම් දේවමාලිගාවට රැගෙනයන විට, කෘතඥතාවය මහත් සතුටකට හැරෙන්නේය. අපගේ කෘතඥතාවයේ එම සාක්ෂියට අවසානය දක්වා දරාසිටින මිතුරන් සහ පවුල් සෑදීමට හැකිය.

---

### මෙම පණිවුඩයෙන් ඉගැන්වීම

අන් අය සමග ශුභාරංචිය බෙදාගැනීම මගින් අපගේ කෘතඥතාවය ගැලවුම්කරුවාණන්ට පෙන්විය හැකි බව සභාපති අයිරින් පැහැදිළි කළේය. සුභාරංචිය ඔබ උගන්වන අයගේ ජීවිතවලට ආශිරවාදිතවූ අන්දම ගැන ඔවුන් සමග සාකච්ඡාකිරීමට ඔබට හැකිය. සුභාරංචි දීමනාව බෙදාගැනීමට ඔවුන් කැමති අය යාච්ඤාවෙන් හඳුනාගෙන ඔවුන් එය කරන අන්දම ගැන සිතාබැලීමටද ඔවුන්ට ආරාධනා කරන්න.

## ළමයි

### ඔබගේ සාක්ෂිය බෙදාගන්න

මේ නත්තල් කාලයේ මෝර්මන්ගේ පොතක ඇතුල් පැත්තේ ඔබගේ සාකිෂිය ලියා එය ඔබගේ මිතුරෙකුට හෝ අසල්වැසියෙකුට දීම මගින් සුභාරංචි දීමනාව බෙදාගැනීමට ඔබට පුළුවන. එය සූදානම්කිරීම සඳහා මෙම පියවරවල් අනුගමනයකරන්න.

1. කඩදාසි කොලයක, අඟල් 41/2 x 61/2 (111/2 x 161/2 සෙ.මී) සෘජු කෝණාස්‍රයක් ඇඳ වැඩිහිටියෙකුට කියා එය කපාගන්න.
2. තවද ඔබගේ පින්තූරයක්—චිත්‍රයක් හෝ ඡායාරූපයක්—එම කොලයේ ඉහළින් තබන්න.
3. ඔබගේ පින්තූරයට පහළින් ඔබගේ සාක්ෂිය ලියන්න.
4. වැඩිහිටියෙකු ලවා එම කොලය මෝර්මන්ගේ පොතේ කවරය ඇතුල්පැත්තේ අලවාගන්න.

## තරුණඅය

### මට මෝර්මන්ගේ පොතක් බෙදාගැනීමට හැකිද?

**ජෝස් ආනට් විසිනි.**

උසස් පාසලේ මගේ පළවෙනි වසරේදී, මෝර්මන්ගේ පොතේ පිටපත් සාමාජික නොවන මිතුරන්ට දීමට මගේ සෙමනේරි ගුරුවරිය මගේ පංතියට ආරාධනා කළාය. මා විශ්වාස කළ නොහැකි ලෙස බියසුළුව සිටියද, මම ආරාධනාව පිළිගත්තෙමි.

ධෛර්යය ඇතිකරගැනීමට මට දින දෙකක් ගතවිය. නමුත් අවසානයේදී දහවල් කෑම පැයේදී මගේ මිතුරියක්වූ බ්‍රිට්නිට පොතක් දී මගේ සාක්ෂියද කෙටියෙන් දැරුවෙමි, පොත වෙනුවෙන් බ්‍රිට්නි මට ස්තුති කළාය,

පාසල් වසර අවසානයේදී, බ්‍රිට්නි වෙන පළාතකට ගිය නමුත්, අපි සම්බන්ධය පැවැත්වූවෙමු. ඇය සිය අළුත් පාසල ගැන කියමින්, ඇයගේ මිතුරියන් බොහොමයක්ම වාගේ සභාවේ සාමාජිකයන් බවත් මට කීවාය. නමුත් කිසි ආත්මික දෙයක් ගැන ඇය මට කීවේ නැත.

මා මගේ දූතමෙහෙයට යාමට පෙර එය වෙනස්විය. මට බ්‍රිට්නිගෙන් ලැබුන පණිවුඩයකින් කියවුනේ මට කීමට ඇයට ලොකු තොරතුරක් ඇති බවය: ඇය බව්තීස්මවීමට යන බවය, එසේම මා ඇයගේ මිතුරියක්වී යහපත් ආදර්ශයක් තැබීම ගැන මට ස්තුතිකිරීමට ඇයට අවශ්‍යබවත් කීවාය.

දෙවියන්වහන්සේ ධර්මදූත අත්දැකීම් නැති 15 හැවිරිදි පිරිමි ළමයාගේ ලැජ්ජාව ඉවත්කර, සුභාරංචිය පිළිගන්නා බව උන්වහන්සේ දැනසිටි අයෙකු හා එය බෙදාගැනීමට ඔහුට මගපෙන්වූසේක. ආත්මයාණන්ට සවන්දීම මගින්, අප සියලුදෙනාටම නැවත පිහිටුවූ සුභාරංචිය ගැන ඉගෙනගැනීමට සිටින ජනතාව සොයාගත හැකි බව මම දනිමි. අපි ස්වාමීන්වහන්සේ වෙත එක් පුද්ගලයෙකු හෝ ගෙනඒමට උපකාරකරන්නේ නම්, අපගේ පියාණන්වහන්සේගේ රාජ්‍යයේ ඔහු හෝ ඇය සමග අපේ සතුට කෙතරම් මහත් වන්නේද! (බලන්න ඩීසහසී 18:15).

**කතුවරයා වොෂින්ටන්, අඑජ ජීවත්වේ.**

© 2013 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/12. පරිවර්තන අනුමැතිය: 6/12. *First Presidency Message, 2013 December* පරිවර්තනයයි. Sinhala. 10672 408

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දිව්‍යමය දූතමෙහෙය: ඒකජනක පුත්‍රයාණන්වහන්සේ

ඇදහිල්ල, පවුල, සහනය

*මෙම පණිවුඩය යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකර බෙදාගත යුතු මොනවාදැයි සොයන්න. ගැලවුම්කරුවාණන්ගේ ජීවිතය සහ දූතමෙහෙය ගැන අවබෝධය මගින් උන්වහන්සේ තුල ඔබගේ ඇදහිල්ල වැඩිවී, බැහැදැක ඉගැන්වීම තුලින් ඔබ පරීක්ෂාකාරීව සිටින අයද ආශිර්වාදිත වන්නේය.* ***reliefsociety.lds.org.***

මෙය ගැලවුම්කරුවාණන්ගේ දූතමෙහෙයේ ගති ලක්ෂණ විදහාපන බැහැදැක ඉගැන්වීමේ පණිවුඩ මාලාවක එක් කොටසකි.

අපගේ ගැලවුම්කරුවාණන්වන, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, ඒකජාතක පුත්‍රයාණන් ලෙස හැඳින්වෙන්නේ, මැරෙනසුළු මවක් සහ අමරණීය පියෙක්ගෙන් ඉපදීමට සිටි එකම තැනැන්වහන්සේ උන්වහන්සේ නිසාය. උන්වහන්සේ සිය දිව්‍යමය බලය දෙවියන්වහන්සේ වන උන්වහන්සේගේ පියාණන්ගෙන් උරුමකරගත් අතර, උන්වහන්සේගේ මව වූ, මරියතුමියගෙන්, මැරෙනසුළු බව උරුමකරගත් නිසා, කුසගින්න, පිපාසය, විඩාව වේදනාව සහ මරණයට යටත්වූසේක.[1]

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පියාණන්ගේ ඒකජාකයාණන්වූ නිසා, උන්වහන්සේට සිය ජීවිතය පහත හෙළීමට සහ නැවත ගැනීමට හැකියාව ලැබින. ශුද්ධ ලියවිලි අපට උගන්වන්නේ, "ක්‍රිස්තුස්වහන්සේගේ වන්දිගෙවීම තුලින්," අප "මරණයෙන් නැවත නැගිටින බවය" (බලන්න යාකොබ් 4:15) එසේම අපි විශ්වාසකරන්නේ නම්, සියල්ලෝම අමරණීයත්වයෙන් සදාකාලික ජීවනයට ඔසවන බවද අපි ඉගෙනගන්නෙමු (බලන්න ඩීසහසී 29:43).

යේසුස්වහන්සේ පියාණන්ගේ ඒකජනක පුත්‍රයාණන් වීමේ අර්ථය අප වඩාත් හොඳින් තේරුම්ගන්නා විට, ක්‍රිස්තුස්වහන්සේ තුල අපගේ ඇදහිල්ල වැඩිවන්නේය, ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ වැඩිහිටි ඩී. ටොඩ් ක්‍රිස්ටොෆර්සන් මෙසේ කීවේය, "යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහිල්ල (1) දෙවියන්වහන්සේගේ ඒකජනක පුත්‍රයාණන් ලෙස උන්වහන්සේගේ තත්වය, (2) උන්වහන්සේගේ අසීමිත වන්දිගෙවීම, සහ (3) උන්වහන්සේගේ සැබෑ නැවතනැගිටීම ගැන විශ්වාසයක් සහ සහතිකවීමකි."[2] නූතන අනාගතවක්තෘවරුන් මෙසේ සහතිකකර ඇතඃ "[යේසුස් ක්‍රිස්තුස්වහන්සේ] වනාහි… මාංශයේ ඒකජනක පුත්‍රයාණන්, ලෝකයේ මිදුම්කරුවාණන්වනසේක."[3]

## *ශුද්ධ ලියවිලිවලින්*

යොහාන් 3:16; දහම සහ ගිවිසුම 20:21–24; මෝසෙස් 5:6–9

## *අපගේ ඉතිහාසයෙන්*

අළුත් ගිවිසුමේ අපි කියවන නම් ඇති සහ නම් නැති කාන්තාවෝ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහිල්ල ක්‍රියාත්මකකර, උන්වහන්සේගේ ඉගැන්වීම් ඉගෙනගෙන ඒ අනුව ජීවත්වී, උන්වහන්සේගේ සේවය, හාස්කම්, සහ තේජස ගැන සාක්ෂිදැරූහ. මෙම කාන්තාවෝ ගැලවීමේ කටයුතුවල ආදර්ශමත් ගෝලයන් සහ වැදගත් සාක්ෂිකරුවන් බවට පත්වූහ.

උදාහරණයක් ලෙස ගැලවුම්කරුවාණන්ගේ දිව්‍යමය භාවය ගැන මාර්තා ශක්තිමත් සාක්ෂියක් දරමින් උන්වහන්සේට මෙසේ කීවාය, "ඔබ දෙවියන්වහන්සේගේ පුත්‍රවූ ලෝකයට එන තැනැන්වහන්සේවූ ක්‍රිස්තුස් බව මම විශ්වාසකරගෙන සිටිමි" (යොහාන් 11:27).

ගැලවුම්කරුවාණන්ගේ මුල්කාලීන සාක්ෂිකරුවන් කිහිපදෙනෙක් වූයේ, උන්වහන්සේගේ මව, මරියා, සහ ඥාති සොහොයුරියවූ එලිසබෙත්ය, ගේබ්‍රියල් දේවදූතයා මරියා බැහැදකීමෙන් පසුව විගසකින්ම, ඇය එලිසබෙත්ව බැහැදුටුවාය. එලිසබෙත් මරියාගේ සුභපැතුම් ඇසූ විගසම, ඇය ශුද්ධාත්මයෙන් පූර්ණවී" (ලූක් 1:41) මරියා දේව පුතායාණන්ගේ මව වන බවට සිය සාක්ෂියද දැරුවාය.

**සටහන**

1. බලන්න *සුභාරංචි මූලධර්ම* (2009), 52–53.
2. ඩී, ටොඩ් ක්‍රිස්ටොෆර්සන්, "Building Faith in Christ," *Liahona,* සැප්තැ. 2012, 13.
3. "ජීවමාන ක්‍රිස්තුස්වහන්සේඃ ප්‍රේරිතවරුන්ගේ සාක්ෂිය," ලියහෝනා, අප්‍රේ. 2000, 2–3.

### *මට කුමක් කළ හැකිද?*

**1.** යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කාර්‍යභාරයන් මා දැන සිටීම වැදගත්වන්නේ මන්ද?

**2.** යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල අපගේ ඇදහිල්ල ගිවිසුම් වලින් තවත් වැඩිවන්නේ කෙසේද?

© 2013 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතියඃ 6/12. පරිවර්තන අනුමැතියඃ 6/12. *Visiting Teaching Message, December 2013* පරිවර්තනයයි. Sinhala. 10672 408